(R) - 2007/07/10

17

a → b

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1466/25 – 2006 ඔක්තෝබර් 13 වැනි සිකුරාදා – 2006.10.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

විධාන අංක ~~09~~ 08

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) (ආ) (ii) වගන්තිය යටතේ විධානය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් රන්මිනි කුලරත්න ජයසූරිය වන මම, 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) (ආ) (ii) වගන්තිය යටතේ ක්‍රියා කරමින්, පහත දැක්වෙන පරිදි මෙයින් විධාන කරමි.

මෙහි පහත ලැයිස්තුගත කර ඇති කලින් ඇසුරුම් කළ භාණ්ඩ, නිෂ්පාදන සහ අයිතමයන් සම්බන්ධ සියලුම ආනයනකරුවන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, අනුයෝජිතයන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් විසින් එම භාණ්ඩ හෝ නිෂ්පාදන ලංකාවට ඇතුළුවන ස්ථානයේදී එම භාණ්ඩ මත ඉංග්‍රීසි භාෂාවෙන් එම භාණ්ඩයට අදාළ "උපරිම සිල්ලර මිල"("Maximum retail Price") යනුවෙන් ලකුණු කර තිබිය යුතුය.

(1) වන උප වගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන්ද, එම භාණ්ඩය මත ඇති ලේබලයක්, විස්තරයක් හෝ එහි මිල ඉවත් කරන, වෙනස් කරන, විනාශ කරන, මකා දමන හෝ විරූප කරන නැතහොත් ලේබලය, විස්තරය හෝ මිල ඉවත්කර ඇති, වෙනස් කර ඇති, විනාශ කර ඇති, මකා දමා ඇති හෝ විරූපකර ඇති යම් භාණ්ඩයක් විකුණා හෝ විකිණීම සඳහා අර්පනය කරන යම් තැනැත්තෙක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

මෙම විධානය පහත දැක්වෙන භාණ්ඩ හා නිෂ්පාදනවලට අදාළ වේ :-

ඇසුරුම් කර විකුණනු ලබන මස් සහ මස් නිෂ්පාදන,

ඇසුරුම්කර විකුණනු ලබන මාළු සහ වෙනත් මුහුදු ආහාර,

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු, පාරිභෝජනය කළ හැකි තෙල් වර්ග,

ඇසුරුම් කළ තේ.

ඇසුරුම් කළ කෝපි ඇට හෝ කෝපි කුඩු,

චොක්ලට් සහ චොක්ලට් පාදක වූ නිෂ්පාදන,

චට්නි වර්ග, අච්චාරු සහ සෝස් වර්ග,

1A-PG 000626 - 550 (2006/10)

පිටිකළ කිරි (සම්පූර්ණ යොදය සහිත මේද අඩු, ළදරු සහ මෝල්ටඩ්)

උකුකළ කිරි,

ළදරු ආහාර,

රෝගීන් සඳහා වන ආහාර,

විස්කෝතු සහ පිටිවලින් සාදන ලද රසකැවිලි වර්ග,

සිමෙන්ති,

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු මිරිස් කුඩු,

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු කොත්තමල්ලි ඇට සහ කුඩු.

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු තුනපහ කුඩු

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු ගම්මිරිස් කුඩු,

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු කහ කුඩු,

ඉදිකිරීම් කර්මාන්තයේ භාවිත කරනු ලබන තීන්ත වර්ග. වානිෂ් සහ ද්‍රාවක වර්ග

X භාජනවල අඩංගු නිවාසවල පාවිච්චි කරන විෂබීජ නාශක.

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු ඖෂධ වර්ග සහ විටමින් වර්ග.

මාජරින්,

බටර්,

ටින්කළ පළතුරු,

පළතුරු යුෂ, කෝඩියල් වර්ග සහ වෙනත් සාදා ඇති බීම වර්ග.

ජෑම්, ජෙලි සහ මාර්මලේඩ්,

යෝගට්,

කෘෂිකාර්මික පොහොර,

කෘෂි රසායනික ද්‍රව්‍ය,

සියිල් බීම,

අයිස් ක්‍රීම්,

කල්තබා ගන්නා ආහාර,

ස්වභාවික ඊස්ට්වලින් සාදන නිෂ්පාදන,

ටින් මාළු,

සී. එෆ්. එල්. විදුලි බුබුළු,

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු පිටි (යම් ධාන්‍ය හෝ ඇට වර්ගවලින් සාදන ලද පිටි).

සබන් (ඇඟ ගල්වන, වෛද්‍ය, කාබොලික්, රැවුල බෑමේ, මෘදු, ද්‍රව, කුඩා ළමුන්ගේ සහ රෙදි සෝදන සබන්),

රෙදි සෝදන කුඩු (කුඩු සහ කැට),

කොකෝවා, බටර්, ආදේශක වලින් සාදන ලද නිෂ්පාදන,

ළදරු නිෂ්පාදන (ෂැම්පු, තෙල්, පවුඩර්, ලෝෂන් වර්ග),

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු කර විකුණන කේක් සහ පැණි රස කෑම වැනි රස කැවිලි,

දත් බෙහෙත්,

බැටරි වර්ග (විදුලි පන්දම් සහ ට්‍රාන්ස්සිස්ටර්),

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු සීනි,

ඇසුරුම් කළ හෝ භාජනවල අඩංගු ධාන්‍ය සහ ඇට වර්ග,

අසුරා විකුණනු ලබන පාන්,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන කරවල සහ උම්බලකඩ,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන චීස්,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන බිත්තර,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන මුදවපු කිරි,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන ද්‍රව කිරි (රස නොකළ, රස කළ හා පැණි රස යෙදූ)

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන පිටි කළ බීම වර්ග,

පානීය ජල බෝතල්,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන නූඩ්ල්ස් වර්මිසෙලි, පැස්ටා සහ මැකරෝනි,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන සෝයා නිෂ්පාදන,

ඇසුරුම් කළ හෝ භාජනවල දමා විකුණනු ලබන අමු, රෝස් කරන ලද ලුණු මිශ්‍ර කර ඇති හෝ කුළු බඩු මිශ්‍ර කර ඇති අල වර්ග, ගෙඩි, කරල් හෝ පාරිභෝජනයට සූදානම් කර ඇති වෙනත් ආහාර,

(2) එක් එක් භාණ්ඩයේ ඇසුරුම හෝ භාජනය මත නිෂ්පාදකයාගේ, සැපයුම්කරුගේ, ආනයකරුගේ හෝ බෙදා හරින්නාගේ නම සහ ලියාපදිංචි කළ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) මෙහිදී "ඇසුරුම හෝ භාජනය" යන වචනවලින් කලින් ඇසුරුම් කරන ලද සිල්ලර නිෂ්පාදන ඇතුළත් ඇසුරුමක් හෝ භාජනයක් අදහස් වේ.

(4) මෙම නියෝග 2007.01.01 දින සිට බලාත්මක වේ.

රන්මිනි කුලරත්න ජයසූරිය,
අධ්‍යක්ෂ ජනරාල්.

2006 සැප්තැම්බර් මස 21 වැනි දින,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02

10-624

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.